සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/08/PM/04/E.Power- 2025

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2025.05.22

**සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/01ට දෙවන එකතුව**

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025**
**සවිබලගැන්වීම සඳහා හඳුනාගත් අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන සහ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) අඩු ආදායම්ලාභී පවුල් සඳහා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**

ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන 2025 ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මගේ සමාංක දරන සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 හා ඊට පළමු එකතුව මඟින් උපදෙස් හා මඟපෙන්වීම් දැනටමත් සිදු කර ඇත.

02. ඒ අනුව දැනටමත් ඔබ දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ඉහත සඳහන් අඩු ආදායම්ලාභී පවුල් සම්බන්ධව ප්‍රතිලාභී පවුල් හඳුනාගැනීම හා මූලික තොරතුරු රැස් කිරීම අවසන් කර ඇති බවට වාර්තා වී ඇත.

මෙහිදී, අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් අතරින් ඉලක්ක පවුල් හඳුනාගැනීම, දැනටමත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම ප්‍රතිලාභී නාම ලේඛන ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පමණක් සිදු කර ඇත.

තවද, අනිකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ට අදාල නාම ලේඛන සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය සමඟ සාකච්ඡා කර ලබාගැනීම සිදු කර, ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව දන්වමි.

03. මෙම චක්‍රලේඛ උපදෙස් සමඟ ඇමුණුම 01 මඟින් ලබා දෙන උපදෙස් හා මඟපෙන්වීම් අනුව, පහත සඳහන් අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් හඳුන්වාදුන් ආකෘතීන්ට පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා අනිකුත් මූලික තොරතුරු රැස් කිරීම කඩිනම් හා නිවැරදිව සිදු කරන ලෙස දැනුම් දෙමි.

i. සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) අඩු ආදායම්ලාභී පවුල්.
ii. අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභී පවුල් (දැනට ප්‍රතිලාභ නාම ලේඛන ලැබී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පමණක්)

04. පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් පුහුණු කරන ලද පුහුණු නිලධාරීන් මඟින් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණුව හා දැනුම ලබා දීම දැනටමත් සිදු කෙරේ.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

05. මෙම චක්‍රලේඛය මඟින් ලබා දෙන උපදෙස්වලට අනුව කටයුතු කර අදාල දිනයන්හි දී මෙම කටයුතු අවසන් කිරීම පිළිබඳව ග්‍රාම නිලධාරී වසම්වල ක්ෂේත්‍ර රාජකාරීවල නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුලු ඊට අදාල අනිකුත් නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලෙස දන්වමි.

06. තවද, දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන සංවර්ධන කමිටු, කෘෂිකාර්මික කමිටු හා අනිකුත් වැඩමුළු/ රැස්වීම් අවස්ථාවලදී ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන පිළිබඳව ආංශික දෙපාර්තමේන්තු ආයතන හා ඊට සම්බන්ධිත නිලධාරීන් දැනුවත් කර එම ආයතනවල සහාය/ සේවාවන් මෙම වැඩසටහනට බද්ධ කිරීමට අදාල කටයුතු කරන ලෙසත් කාරුණිකව ඉල්ලමි.

සැලසුම් කර ඇති පරිදි, පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සහාය හා කැපවීම අපේක්ෂා කරමි.

**සී.ඩී. කළුආරච්චි,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය- කා.දැ.ස
2. අතිරේක ලේකම් (ප්‍රජා සවිබලගැන්වීම්), සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ස
4. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කා.දැ.ස
5. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
6. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
8. අංශ ප්‍රධානීන්, (ජීවනෝපාය සංවර්ධන, සමාජ සංවර්ධන, අළෙවි, ප්‍රජාමූල සංවිධාන, නීති, මානව සම්පත් සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සුභ සාධන, ක්ෂුද්‍රමූල්‍ය, තොරතුරු තාක්ෂණ, මෙහෙයුම් හා ඇගයුම්)-සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා අ.ක.ස
9. මූලස්ථාන/ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ බැංකු කළමනාකරුවන්/ ව්‍යාපෘති කළමණාකරුවන් - දැ.ගැ.ස හා අ.ක.ස